සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 62 S |
|---|---|---|
| නම ............................................ | පුරවැසි අධ්‍යාපනය I - කොටස | කාලය පැය දෙකයි |

● සැළකිය යුතුයි:-
- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ● එක් ප්‍රශ්ණයකට ලකුණු 2 බැගින් හිමි වේ.

● **වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

01. සෑම පුද්ගලයෙක්ම උපතත් සමඟ සාමාජිකත්වය ලබන සමාජ ඒකකය වන්නේ ...................................... ය. (පාසල / පවුල / පෙර පාසල)

02. උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා හා සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඇති කරගන්නා වූ අභිමානය ............................ ............................ (ආත්මාවබෝධය/ ආත්ම විශ්වාසය/ ආත්මාභිමානය)

03. පවුලේ සාමාජිකයන්ගේ පැවැත්ම හා ............................................ සලසාදීම සඳහා නීත්‍යානුකූල රැකියාවක යෙදීමෙන් ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීම අත්‍යවශ්‍ය වේ. ( සංවර්ධනය / අභිවෘද්ධිය/ ආරක්ෂාව)

04. චරිතාපදාන කියවීම තුළින් පුද්ගල ජීවිතයට ........................................ ලබාගත හැකිය. (උපදේශ/ ආදර්ශ/ අවවාද)

05. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට මුහුණදීමට සිදුවන අභියෝග ජයගෙන අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට ....................................................කටයුතු කළ යුතුය. (පරිත්‍යාගශීලීව/ උපක්‍රමශීලීව/ අධිෂ්ඨානශීලීව)

● **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. පවුල තුළ සමීප අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම නිසා පවුලේ සාමාජිකයන් අතර බැඳීම් ඉතා ශක්තිමත් වේ. (     )

07. ඥාතීන් සමූහයකින් යුක්ත පරම්පරා තුනක් හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල් ඒකකය න්‍යෂ්ටික පවුල් ඒකකයක් වේ. (     )

08. පවුල තුළින් සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පුහුණුව ලැබේ. (     )

09. ඉක්මන් කෝපය පුද්ගලයෙකු තුළ කළහකාරී වාතාවරණයක් නිර්මාණය කිරීමට හේතුවන ලක්ෂණයකි. (     )

10. වෙළඳසලේ යම් කිසි භාණ්ඩයක හිඟතාවයක් පවතින විට එම භාණ්ඩයේ මිල අඩුවේ. (     )

● **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළව නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ඔබේ පියාගේ අයියාගේ බිරිඳ හඳුන්වන ඥාති පදය වන්නේ,
1. ලොකු නැන්දා 2. ලොකු අම්මා 3. පුංචි අම්මා 4. කුඩම්මා

12. ඔබට පවුලෙන් ලැබෙන අයිතිවාසිකමක් වන්නේ මින් කුමක්ද?
1. ආගමික අධ්‍යාපනයක් ලබාදීම. 2. නිපුණතා සංවර්ධනය කිරීම.
3. කැමති රැකියාවක් කිරීම. 4. ආහාර හා පෝෂණය ලබාදීම.

13. යම් පුද්ගලයෙකු දුකට පත් වූ අවස්ථාවක දක්වන ප්‍රතික්‍රියාවක් වන්නේ මින් කුමක්ද?
1. ඔල්වරසන් දීම    2. අත්පුඩි ගැසීම    3. මුහුණ මලානික වීම.    4. බැණ වැදීම

14. දිගුකාලීන ජීවිත අරමුණු පමණක් දැක්වෙන නිවැරදි වරණය වන්නේ
1. සාමාන්‍ය පෙළ විභාගයෙන් A9 ලබා ගැනීම, උසස් පෙළ විභාගයෙන් සමත්ව විශ්ව විද්‍යාලයට යාම.
2. ශිෂ්‍ය නායකයෙකු වීම, ජාතික මට්ටමේ ක්‍රීඩකයෙකු වීම.
3. පංති නායකයෙකු වීම, තූර්යවාදක කණ්ඩායමට ඇතුළත් වීම.
4. පංතියේ පළමු වැනියා වීම, ශිෂ්‍ය නායකයෙකු වීම.

15. බුද්ධිමත් පාරිභෝගිකයා භාණ්ඩ මිලදී ගැනීමේ දී ක්‍රියාත්මක විය යුතු ආකාරය දැක්වෙන වඩාත් නිවැරදි වරණය මින් කුමක්ද ?
1. අඩු මිලට ගුණාත්මක බවින් උසස් භාණ්ඩ මිලදී ගැනීම.
2. වැඩි මිලට ගුණාත්මක බවින් අඩු භාණ්ඩ මිලදි ගැනීම
3. වැඩි මිලට ගුණාත්මක බවින් වැඩි භාණ්ඩ මිලදී ගැනීම.
4. අඩු මිලට ගුණාත්මක බවින් අඩු භාණ්ඩ මිලදී ගැනීම.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**



A

16. A පින්තූරයෙන් දැක්වෙන අවස්ථාවේදී ඉටුකෙරන කාර්යයන් 2 ක් ලියන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

17. එවැනි අවස්ථාවක සිදුවිය හැකි අනතුරු 2 ක් ලියන්න.

1. ..........................................................................................

2. ..........................................................................................



B



C

18. ඉහත B, C පින්තූරවලින් දැක්වෙන ක්‍රියාකාරකම් ආශ්‍රිත ආගමික ස්ථාන නම් කරන්න.

B - ....................................................    C - ....................................................

19. එම ආගමික ස්ථාන හා සම්බන්ධ ආගම් නම් කරන්න.

B - ....................................................    C - ....................................................

20. ඉහත පින්තූර වලින් දැක්වෙන ආගම් වලට අදාළ ආගමික ග්‍රන්ථ නම් කරන්න.

B - ....................................................    C - ....................................................  (2x20 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) i. පහත සඳහන් පින්තූරවල දැක්වෙන චිත්තවේගී තත්වයන් නම් කරන්න.






A .................... B .................... C ........................ D ........................ (ල. 04)

ii. අයහපත් චිත්තවේගි තත්වයන් පාලනය කිරීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් 4 ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................ (ල. 04)

iii.



A



B

ඉහත පින්තූරවල දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ රැකියා අවස්ථා 2 බැගින් ලියන්න.

A - 1. ........................................................... 2. ...........................................................

B -1. ........................................................... 2. ...........................................................

(ල. 04)

iv. ඇසුරුම් සහිත නිෂ්පාදනවල දක්නට ලැබෙන ලක්ෂණ 4 ක් ලියන්න.

1. .......................................................... 2. ..........................................................

3. .......................................................... 4. .......................................................... (ල. 04)

(02)



A



B

i. ඉහත A B පින්තූරවල දැක්වෙන පවුල් ඒකකනම් කරන්න.

A - ................................................. B - ............................................. (ල. 02)

ii. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්‍ෂණ 3 ක් ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. .............................................................................................................................. (ල. 03)

iii. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් සහ ඔබෙන් පවුලට විය යුතු යුතුකම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඔබට පවුලෙන් ලැබෙන අයිතිවාසිකම් | ඔබෙන් පවුලට විය යුතු යුතුකම් |
|---|---|
| 1. ............................................................. | 1. ............................................................. |
| 2. ............................................................. | 2. ............................................................. |
| 3. ............................................................. | 3. ............................................................. |

(ල. 06)

(03) i. 7 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ඔබගේ අරමුණ වන්නේ වාර පරීක්‍ෂනයෙන්සෑම විෂයකටම ඉහල ලකුණු ලබාගැනීම නම් ඒ සඳහා ඔබ අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග 3 ක් සඳහන් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. .............................................................................................................................. (ල. 03)

ii. උචිත අරමුණු තෝරා ගැනීමේදීඅවදානය යොමු කල යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. .............................................................................................................................. (ල. 03)

iii.

| |
|---|
| පරිත්‍යාගශීලී බව / ක්‍ෂණික කෝපය / සත්‍යවාදී බව<br>නිවැරදි තීරණ ගැනීම / ආත්මාර්තකාමීබව/<br>අන් අයට සවන්දීම / කලහකාරීබව / අවංකබව |

පුද්ගලයා තුල දක්නට ලැබෙන ලක්‍ෂන කිහිපයක් ඉහත චතුරස්‍රයේ දැක්වේ. එයින් පුද්ගලයා තුළ ආත්මාභිමානය ඇති කර ගැනිම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංග තෝරා ලියන්න.

1. ....................................................................... 2. .......................................................................

3. ....................................................................... 4. .......................................................................

5. ....................................................................... (ල. 05)

(04) i. ඔබ තුළ යහපත් ගතිගුණ ප්‍රගුණ කිරීම සඳහා පහත ආයතන වලින් කෙරෙන කාර්යයන් 2 බැගින් ලියන්න.

ආගමික ආයතන → 1. ...........................................................................
→ 2. ...........................................................................

පාසල → 1. ...........................................................................
→ 2. ........................................................................... (ල. 04)

ii. කළණ මිතුරෙකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග 3 ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ (ල. 03)

iii. විවේකය ඵලදායීව ගත කිරීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග 4 ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................ (ල. 04)

(05) i. වඩාත් නිවැරදි සේ 'අ' සහ 'ආ' තීරු යා කරන්න.

| 'අ' | 'ආ' |
| --- | --- |
| ක්‍රීඩාව | චිත්තවේග පාලනය |
| පුස්තකාලය | අයහපත් ක්‍රියාවන්ට යොමුවීම |
| ගීත ගායනය | පංච දැමීම |
| ගෘහස්ථ ක්‍රීඩාවකි | දැනුම වර්ධනය කර ගැනීම. |
| නරක මිතුරන් ඇසුර | ජය පරාජය විඳ දරාගත හැකිවීම |
| | මේවර කෙළිය |

(ල. 05)

ii.

මව්පියන් විදේශගත වීම/ තාක්ෂණික උපකරණ භාවිතය
මව සහ පියා දෙදෙනාම රැකියාවල නිරතවීම
විවේකය අඩුවීම /අසල්වැසි ආකල්ප /
නිර්මාණාත්මක චින්තනය

ඉහත කරුණු වලින් වර්තමාන පවුල් ඒකකය මුහුණපාන අභියෝග 3 ක් තෝරා ලියන්න.

1. ..................................................................................................................
2. ..................................................................................................................
3. .................................................................................................................. (ල. 03)

iii. චිත්තවේග නිසිලෙස පාලනය කර නොගැනීම නිසා සිදුවන අයහපත් ප්‍රතිඵල 3 ක් ලියන්න.

1. ..................................................................................................................
2. ..................................................................................................................
3. .................................................................................................................. (ල. 03)

(06) i. පවුල තුළ පවතින සම්ප්‍රදායන් තුනක් ලියන්න.

1. ..................................................................................................................

2. ..................................................................................................................

3. .................................................................................................................. (ල. 03)

ii. ඔබ අසල්වැසියන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා 4ක් ලියන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ 4. ................................................................ (ල. 04)

iii. අසල්වැසියන් සමඟ කටයුතු කිරීමේ දී ඔබ තුල වර්ධනය වන ගුණාංග 4 ක් ලියන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ 4. ................................................................ (ල. 04)

(07) පහත උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

4 - පුද්ගලයාගේ ජීවිත සාර්ථකත්වයට බලපාන හිතකර ස්ථානයකි. (ආයතනයකි)

5 - බෝ නොවන රෝගයකි

6 - මේවා සාමාජිකයන් අතර සාධාරණව බෙදීම පවුලේ පොදු ලක්‍ෂණයකි.

8 - දිගුකාලීන අරමුණකි.

9 - පොත්පත් කියවීමෙන් මෙය ලැබේ.

<u>පහළට</u>

1 - ආගමික ආයතන මඟින් මේවා ලබා දේ.


2 - මෙම දිවි පැවැත්ම යහපත් පුද්ගලයෙකු සතු ගුණාංගයකි.

3 - පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත්වීමෙන් මෙම දැනුම ලැබේ.

7 - බාප්පාගේ වැඩිමහල් දියණියට මෙම ඥාති පදය භාවිත කරයි.

10 - සෑම පුද්ගලයෙක් තුලම තිබිය යුතු උතුම් ගුණාංගයකි.

11- වැඩිහිටියන්ට මෙසේ කිරීම පොඩිහිටියන් තුළ තිබිය යුතු යහපත් ගුණාංගයකි.



# පළමු වාර පරීක්ෂණය - 2019
# පුරවැසි අධ්‍යාපනය
# පිළිතුරු පත්‍රය
# 07 ශ්‍රේණිය
## I කොටස

| | | |
|---|---|---|
| 1 - පවුල | 6 - ✓ | 11 - 2 |
| 2 - ආත්මාභිමානය | 7 - ✗ | 12 - 4 |
| 3 - අභිවෘද්ධිය | 8 - ✓ | 13 - 3 |
| 4 - ආදර්ශ | 9 - ✓ | 14 - 1 |
| 5 - අධිෂ්ඨානශීලීව | 10 - ✗ | 15 - 1 |

16. උදළු ගෑම, අතුගෑම, ගස් කැපීම ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.
17. කැපීම්, සීරීම්, තුවාලවීම්, තැලීම් ආදි ගැළපෙන නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.
18. B - හින්දු කෝවිල C - මුස්ලිම් පල්ලිය
19. B - හින්දු C - ඉස්ලාම්
20. B - වේද ග්‍රන්ථ C - අල්කුරානය / ශුද්ධ වූ කුරානය

## II කොටස

(01) i. A - සතුට B - දුක C - බය D - කෝපය

ii. 1. ආගමික කටයුතු / භාවනා කිරීම්
2. මිතුරන් සමඟ කතා කිරීම
3. සෞන්දර්යාත්මක කටයුතුවල නිරතවීම (ගීත ගායනය/ චිත්‍ර ඇඳීම / නර්තනය ආදී )
4. මල් වගා කිරීම
5. ක්‍රීඩාවට යොමු වීම. ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න.

iii. A - මාළු ඇල්ලීම / විකිණීම / සැමන් නිෂ්පාදනය / කරවල වේලීම / විකිණීම
B - වෛද්‍ය / හෙද හෙදියන් / සුළු සේවකයන් / විකිරණ ශිල්පීන් ආදී ක්ෂේත්‍රයට අදාළ රැකියා ලියා ඇත්නම් ලකුණු දෙන්න.

iv. නිෂ්පාදිත දිනය / කල් ඉකුත්වීමේ දිනය / ශුද්ධ බර/ අඩංගු ද්‍රව්‍ය / උපරිම සිල්ලර මිල

(02) i. A - න්‍යෂ්ටික පවුල
B - විස්තෘත පවුල

ii. 1. ඥාතීත්වය මත ගොඩනැගී තිබීම.
2. සාමාජිකයන් එක් වාසස්ථානයක ජීවත්වීම.
3. සාමාජිකයන් අතර සමීප සම්බන්ධතා පැවතීම. (පෙළ පොත 5 පිටුව)

iii. <u>අයිතිවාසිකම්</u>
1. ආහාර හා පෝෂණය
2. සෞඛ්‍ය පහසුකම් ලබාදීම.
3. ආදරය , දයාව සෙනෙහස ලබාදීම.
4. ආරක්ෂාව හා රැකවරණය ලබාදීම. (පෙළ පොත පිටුව 36)

<u>යුතුකම්</u>
1. දෙමාපියන්ට සැළකීම/ ගරු කිරීම
2. බාල සහෝදර සහෝදරියන් රැකබලා ගැනීම.
3. මිල මුදල් ආරක්ෂා කිරීම.
4. දෙමව්පියන්ගේ වැඩවලට සහයෝගය දැක්වීම.
5. දෙමාපියන් නැති අවස්ථාවල පවුලේ නායකත්වය ගැනීම වැනි නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.

(03) i. 1. දිනපතා පාසල් යාම
2. ගුරුවරුන්ට කීකරුව හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම.
3. කාල සටහනකට අනුව වැඩ කිරීම.
4. අඩු සාධන මට්ටමක පවතින විෂයන් හඳුනාගෙන ඒවාට වැඩියෙන් මහන්සිවීම.
5. නිතර නිතර අභ්‍යාස කිරීම. (පෙළ පොත පිටුව7, 8 )

ii. 1. හැකියාවන්ට හා දක්ෂතාවයන්ට ගැළපෙන අරමුණු තෝරා ගැනීම.
2. අනුචිත දේ නිවැරදිව හඳුනාගැනීම.
3. කිසිම පැකිලීමකින් තොරව අනුචිත දේ බැහැර කිරීම.

iii. පරිත්‍යාගශීලී බව / සත්‍යවාදී බව / නිවැරදි තීරණ ගැනීම / අන් අයට සවන් දීම/ අවංක බව

(04) i. <u>ආගමික ආයතන</u>

දහම් දැනුම ලබාදීම / ගුණ ධර්ම හඳුන්වාදීම (කියාදීම) ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න.

<u>පාසල</u>

නිසි අධ්‍යාපනය ලබාදීම/ සාරධර්ම ප්‍රගුණ කරවීම / සාරධර්ම වර්ධනය වන ක්‍රියාකාරකම් වලට සිසුන් යොමු කිරීම ආදී නිවැරදි ගැළපෙන පිළිතුරු වලට ලකුණු දෙන්න.

ii. 1. හොඳ නරක කියාදීම
2. නිරන්තර යහපතෙහි යෙදවීම.
3. අයහපත් ක්‍රියාවන්ගෙන් මුදවා ගැනීම.
4. කරදරයක දී පිහිට වීම.

iii.
- ❖ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් වල යෙදීම.
- ❖ පොත් පත් කියවීම
- ❖ හොඳ මාධ්‍ය වැඩසටහන්වලට සවන්දීම.
- ❖ පරිසර අලංකරණ කටයුතුවල නිරත වීම. (නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න)

(05) i.

| | |
|---|---|
| ක්‍රීඩාව | - ජය පරාජය විඳදාරගැනීමට හැකිවීම. |
| පුස්තකාලය | - දැනුම වර්ධනය කරගැනීම. |
| ගීත ගායනය | - චිත්තවේග පාලනය |
| ගෘහස්ථ ක්‍රීඩාවක් | - පංච දැමීම |
| නරක මිතුරන් ඇසුර | - අයහපත් ක්‍රියාවන්ට යොමුවීම. |

ii. 1. දෙමව්පියන් විදේශ රැකියාවල නිරත වීම.
2. මව පියා දෙදෙනාම රැකියාවල නිරත වීම.
3. විවේකය අඩුවීම. (පෙළ පොත 25 පිටුව)

iii. 1. මානසික සෞඛ්‍ය බිඳවැටීම.
2. ශාරීරික සෞඛ්‍ය බිඳවැටීම.
3. පවුල් පරිසරය අවුල් සහගත වීම.
4. සමාජයේ පිළිකුල් සහගත පුද්ගලයෙක්වීම.

(06) i.
- ❖ දිනපතා උදේ සවස ආගමික කටයුතු කිරීම.
- ❖ නිවසින් බැහැර යනවිට දෙමව්පියන් වැඩිහිටියන් නැමද ආශිර්වාද ලබාගැනීම.
- ❖ පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම. (පෙළ පොත 43 පිටුව)

ii
- ❖ පොදු ආගමික උත්සව වලදී
- ❖ ශ්‍රමදාන කටයුතු වලදී
- ❖ කුඹුරු වැඩවලදී
- ❖ දානමය පිංකම් අවස්ථාවලදී
- ❖ අවමඟුල් අවස්ථාවලදී
- ❖ නිවාස තැනීම් සඳහා ගෙපිල කැපීම වැනි අවස්ථා

iii. එකමුතුකම / සහෝදරත්වය / සහජීවනය / ඉවසීම/ අන්මත වලට ගරු කිරීම / හොඳින් සවන්දීම ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න.

(07) i.

| <u>හරහට</u> | <u>පහළට</u> |
|---|---|
| 4 - පාසල | 1 - දහම් දැනුම |
| 5 - හදවත් රෝග | 2 - සරල |
| 6 - සම්පත් | 3 - පාරම්පරික |
| 8 - නායකයෙක් වීම | 7 - අක්කා |
| 9 - දැනුම | 10 - ඉවසීම |
| | 11 - ගරු |